දකුණු පළාත් සභාව - 2021
-------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

දකුණු පළාත් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2022 ඔක්තෝබර් 28 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ඔක්තෝබර් 21 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2 ) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනම ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර දකුණු පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට දකුණු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------**

**1.2.1** **ගණකාධිකරණ අඩුපාඩු**

**---------------------------**

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------ | නිර්දේශය<br>---------- |
|---|---|---|---|
| (අ) | දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙහි 2021 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් ශේෂය රු.677,608,036 ක් වුවද පළාත් අරමුදල් ගිණුමේ එය රු.673,254,332 ක් ලෙස දක්වා තිබීමෙන් පළාත් අරමුදල් ගිණුමේ ශුද්ධ වත්කම් රු.4,353,704 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ ආයතනයේ ශුද්ධ වත්කම් නිවැරදිව සකස් කරන ලෙස උපදෙස් දී ඇති බව. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂය සහ අරමුදල් ගිණුමේ ශේෂය සසඳා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දේපළ පිරියත උපකරණ වල සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය වටිනාකම රු.1,661,792,690 ක් වුවද එය මූල්‍ය ප්‍රකාශනවල රු.1,590,941,716 ක් ලෙස දක්වා තිබීම නිසා වර්ෂයේ ක්ෂය වියදම රු.70,850,974 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ස්ථාවර වත්කම් ලේඛන පළාත් භාණ්ඩාගාරය විසින් පවත්වා නොගන්නා අතර මෙම වැරදි අදාළ වැය ශීර්ෂ මඟින් සිදුකර ඇති බව. | පළාත් අරමුදල් ගිණුම සැකසීමේදී ක්ෂය කිරීම්වල නිවැරදි භාවය පරීක්ෂා කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඇ) | එකතුව රු.847,478,918 ක් වටිනා දේපළ පිරියත උපකරණවලට අදාළ ක්ෂය වෙන්කිරීම් රු.86,659,938 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | ස්ථාවර වත්කම් ලේඛන පළාත් භාණ්ඩාගාරය විසින් පවත්වා නොගන්නා අතර අවසාන ශේෂය පමණක් ආකෘතියක් මඟින් ගෙන්වා ගන්නා බවත් මෙම වැරදි වැය ශීර්ෂ මඟින් සිදුකර ඇති බවත් දන්වමි. | පළාත් අරමුදල් ගිණුම සැකසීමේදී ක්ෂය කිරීම්වල නිවැරදි භාවය පරීක්ෂා කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඈ) | දකුණු පළාත් සභා අරමුදල් ගිණුම පිළියෙල කිරීමේදී හීනවන ශේෂ ක්‍රමය මත දේපළ පිරියත උපකරණ ක්ෂය කිරීම සිදුකර තිබුණද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගිණුම් පිළියෙල කිරීමේදී සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කර තිබුණි. ඒ අනුව වර්ෂයේ ක්ෂය රු.869,836 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ස්ථාවර වත්කම් ක්ෂය ගණනය කිරීම් පළාත් භාණ්ඩාගාරය විසින් සිදු නොකරන බවත්, එම වත්කම් පවත්වාගෙන යනු ලබන වැය ශීර්ෂය මඟින් සිදුකරනු ලබන බව. | පළාත් අරමුදල් ගිණුම සැකසීමේදී අනුගමනය කරනු ලබන ක්ෂය ප්‍රතිපත්තිය මත වැය ශීර්ෂ 26 හිම ක්ෂය ගණනය කිරීම සිදුකළ යුතුය. |

1.2.2 නොසැසඳූ පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් අරමුදල් ගිණුමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ දකුණු පළාතේ පළාත් පාලන ආයතනවලට ගෙවිය යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ පිළිවෙලින් රු.183,576,902 ක් හා රු.53,704,183 ක් වුවද, අදාළ පළාත් පාලන ආයතන විසින් සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව එම අගයයන් පිළිවෙලින් රු.2,133,069,606 ක් සහ රු.125,669,921 ක් විය. ඒ අනුව උසාවි දඩ හා මුද්දර ගාස්තුවල එකතුව රු.2,021,458,442 ක වෙනසක් පැවතුණි. | පළාත් අරමුදල් අගය නිවැරදි බවත් පළාත් පාලන ආයතන විසින් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අගයයන් පිළිබඳව තහවුරුවක් ලබා දිය නොහැකි බව. | අරමුදල් ගිණුමේ අගයයන් සහ පළාත් පාලන ආයතන වල දක්වා ඇති අගයන් සැසඳීම් කළ යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව දකුණු පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

--------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාත්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය 302 - දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **කළමනාකරණ අකාර්යක්ෂමතා** | | |
| දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දකුණු පළාත් සහා සිංහල මාධ්‍ය පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - (2021 වර්ෂය)සඳහා 10,493 ක ගෙන් අයදුම්පත් ලැබී තිබුණු අතර, අයදුම්කරුවන් 10,312 ක් විසින් රු.1000 බැගින් රු.10,312,000 ක මුදලක් විභාග ගාස්තු ලෙස ගෙවා තිබුණද, ජාතික හා පළාත් සභා පාසල්වල ගුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර ඇති බැවින් අදාළ මුදල් අයදුම්කරුවන් වෙත නැවත ලබා දෙන ලෙස ආණ්ඩුකාරවර උපදෙස් දී තිබුණද අයදුම්කරුවන් වෙත නියමිත මුදල් ආපසු ගෙවා නොතිබුණි. | මෙම විභාග ගාස්තු කාර්යාලයේ ජංගම ගිණුම් වෙත තැන්පතු ලෙස ලබාගෙන මාර්ගගත ක්‍රමය යටතේ අයදුම් කිරීම සිදුකරන ලද බවත්, අයදුම්පත් සහ රිසිට්පත් තැපැල් මඟින් ගෙන්වා ගැනීම සිදු නොකළ බවත්, ඒ අනුව අයදුම්කරුවන්ට මුදල් ගෙවීමට ප්‍රායෝගික ක්‍රමවේදයක් සකසා ගැනීමට නොහැකි වීම මත මුදල් ගෙවීම් මෙතෙක් සිදුකර නොමැති බව. | අයදුම්කරුවන් ගෙවන ලද විභාග ගාස්තු නැවත ලබා දීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ශීර්ෂය - 304 දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, ප්‍රවාහන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සංචාරක සහ ඉංජිනේරු සේවා අමාත්‍යාංශය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **මෙහෙයුම් අකාර්යක්ෂමතා** | | |
| විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන වැඩසටහන යටතේ වැසිකිළි ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේදී දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය රු.මිලියන 35 ක ප්‍රතිපාදන වලින් අදියර 03 කින් ප්‍රතිලාභියාට රු.40,000 ක් ලබා දීමේ | 2020 වර්ෂයේ වැඩි කාලයක් රට වසා තැබීම හේතුවෙන් සහ පැවැති මැතිවරණ හේතුවෙන් ව්‍යාපෘතිය තාවකාලිකව නතර කරන ලෙස මැතිවරණ කොමසාරිස්වරයා උපදෙස් දෙන | ව්‍යාපෘති නිසිපරිදි ඉටුකර අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| වැඩසටහන වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට රු.19,248,000 ක් වියදම් කර තිබුණි. වැඩ නිම කළ ප්‍රතිලාභීන් 232 ට පමණක් මුළු මුදලම ලැබී තිබුණු අතර පළමු හා දෙවන වටයේ මුදල් පමණක් ගෙවන ලද රු.9,968,000 ක මුදලින් වැඩ නිම නොකිරීම නිසා අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි. ව්‍යාපෘතිය යටතේ වැසිකිළි ඉදිකිරීම වෙනුවෙන් 2021 මාර්තු මස ලියන ලද රු.380,000 ක් වටිනා චෙක්පත් 19 ක් 2022 පෙබරවාරි 10 දින වන විටත් අදාළ පාර්ශවයන්ට භාර නොදී අත රඳවා ගෙන තිබුණු අතර වටිනාකම රු.181,000 ක් වූ චෙක්පත් 25 ක් රාජ්‍ය ආදායමට බැර කර තිබුණි. | ලද බැවින් ප්‍රතිලාභීන්ට ගෙවීමට නොහැකි විය. 2020.06.30 දිනෙන් මෙම ව්‍යාපෘතිය අවසන් කරන ලෙස උපදෙස් ලද බැවින් චෙක්පත් නිකුත් කිරීම තාවකාලිකව නතර කළ බවත් තවදුරටත් මේ පිළිබඳව සොයා බලා අවශ්‍ය පියවර ගන්නා බව. | |

### 1.5.2.1 දකුණු පළාත් සංවර්ධන අධිකාරිය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **ලැබිය යුතු ගිණුම්**<br><br>දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ ජංගම නොවන ලැබිය යුතු දෑ රු.12,831,262 ක ශේෂයෙහි ඇතුළත් 2021 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු රු.2,760,717 ක 2001 වසරේ සිට පැවත එන අක්‍රීය ණය ශේෂය අදාළ ව්‍යාපෘති සහ කර්මාන්ත හිමියන්ගෙන් අයකර ගැනීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2021.12.31 දිනට රු.1,654,974 ක් හා රු.553,505 ක දේශීය බීජ ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් කාර්යාලයේ නීති අංශය මඟින් නීති කටයුතු සිදුකරමින් පවතින බව. | හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2.2 රුහුණු සංචාරක කාර්යාංශය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රුහුණු සංචාරක කාර්යාංශය විසින් රු.31,609,408 ක් වැය කර ඉදිකර තිබුණු හික්කඩුව අභිමංසල ගොඩනැගිල්ල 2016 අප්‍රේල් 15 දින ගිවිසුමක් මත බාහිර පාර්ශවයකට බදු දී තිබුණද, නියමිත පරිදි මාසිකව බදු අයනොකිරීම නිසා රු.10,100,000 ක හිඟ බදු මුදලක් හා ඊට අදාළ දඩ මුදල් රු.1,350,000 ක් වශයෙන් එකතුව රු.11,450,000 ක් හිඟව පැවතුණි. | ආණ්ඩුකාරවර තීරණය අනුව 2022.03.31 දිනට හිඟ මුදල් සම්පූර්ණයෙන්ම ගෙවන්නේ නම් දඩ මුදල් නිදහස් කරනු ලබන බව හා පවරා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින බව. | හිඟ බදු සහ දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ආ) නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

--------------------------------------------

| | | |
|---|---|---|
| රුහුණු සංචාරක කාර්යාංශයේ ආයතන 03 කට අදාළ වත්කම් තුළ ඇති රු.102,985,823 ක් වූ වත්කම් 2021 දෙසැම්බර් 31 දින වන විට අභාවිතව පැවතුණි. | මෙම ආයතන බදු දීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | අදාළ වත්කම් වලින් උපරිම ප්‍රයෝජනය ගැනීමට කටයුතු කළ යුතුය. |

1.5.2.3 <u>දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය</u>

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ----------------------- | ---------- |
| | මෙහෙයුම් අකාර්යක්ෂමතා<br>------------------------------ | | |
| (අ) | දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් කොරෝනා වසංගත තත්ත්වය හමුවේ බස්රථ රියදුරන් හා කොන්දොස්තරවරුන්ට රු.10,000 ක් බැගින් රු.5,800,000 ක මුදලක් ණය ලෙස 2019 වර්ෂය තුළ ලබා දී තිබුණු අතර එම ණය මුදලින් 2021 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් රු.5,329,000 ක ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත රු.10,000 බැගින් රු.5,800,000 ක ණය මුදලක් ලබාදෙන ලදී. ඉන් රු.581,000 ක් අයකර ගෙන ඇති අතර ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යටතේ 2021 වර්ෂය සඳහා දකුණු පළාත තුළ මගී සේවා අවසර බලපත්‍ර 1,316 ක් ලබාදීම වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු හිඟ ආදායම රු.233,500 ක් සහ අක්‍රීය බලපත්‍ර වලින් 2021 දෙසැම්බර් 31 දිනට අහිමි වී තිබුණු බලපත්‍ර ගාස්තු ආදායම සහ සේවා ගාස්තු ආදායම රු.731,250 ක් ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තවදුරටත් සහන ඉල්ලීම් ප්‍රවාහන අමාත්‍යතුමිය විසින් ආණ්ඩුකාරවර වෙත ඉදිරිපත් කර ඇති බව හා අධිකාරියෙහි පාලක මණ්ඩලය දැනුවත් කර ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

1.5.3 <u>ශීර්ෂය - 305 දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව</u>

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ----------------------- | ---------- |
| (අ) | මෙහෙයුම් අකාර්යක්ෂමතා<br>------------------------------ | | |
| (i) | උණවටුන ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශයේ ඖෂධ ගබඩාවේ 2022 පෙබරවාරි 28 දිනට පැවති ඖෂධ අතුරින් 2021 අගෝස්තු 31 දින සිට 2022 පෙබරවාරි 28 දින දක්වා කාලීනව අවශ්‍යතා අනුව රෝහල් අතර බෙදානොහැරීම නිසා කල් ඉකුත් වී තිබුණු රු.6,004,076 ක් වටිනා ඖෂධ | මෙම ඖෂධ තොග අපහරණය කිරීම් කටයුතු මෙම දිනවල සිදුවන අතර අපහරණයෙන් පසු අදාල තොරතුරු විගණනය වෙත | ඖෂධ කළමනාකරණ පද්ධතිය මඟින් ඖෂධ අවශ්‍යතා හඳුනා ගෙන |

| | | | |
|---|---|---|---|
| | 25 කට අයත් ඖෂධ ඒකක 47,387 ක් පැවතුණද අපහරණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරිපත් කරන බව. | කල්ඉකුත් වීමට ඉඩ නොදී ඖෂධ බෙදාහැරීමට කටයුතු කල යුතුය. |
| (ii) | ඖෂධ කළමනාකරණ පද්ධතිය නිසිපරිදි ක්‍රියාවට නොනැගීමෙන් උණවටුන ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශයේ ඖෂධ ගබඩාවේ 2022 පෙබරවාරි 28 දිනට පැවති ඖෂධ අතුරින් 2022 ඔක්තෝබර් සිට 2023 සැප්තැම්බර් දක්වා කාලය ඇතුළත කල් ඉකුත්වීමට නියමිතව තිබුණු ගුණාත්මයෙන් අඩු වූ ඖෂධ වර්ග 08 කට අයත් රු.2,010,887 ක් වටිනා, ඖෂධ ඒකක 126,404 ක් පැවතුණි. | මෙම ඖෂධ තොග අපහරණය කිරීම් කටයුතු සිදුකරන බව. | ඖෂධ කළමනාකරණ පද්ධතිය මඟින් ඖෂධ අවශ්‍යතා හඳුනා ගෙන කල්ඉකුත් වීමට ඉඩ නොදී ඖෂධ බෙදාහැරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු<br>-------------------------------------- | | |
| | මාතර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය යටතේ පවතින රම්‍යා මොහොට්ටි ළය චිකිත්සාගාරය දැයට කිරුළ වැඩසටහන මඟින් අදියර I සහ II යටතේ රු.90,533,375 ක ඇස්තමේන්තුවක් මත රු.70,129,814 ක ගිවිසුම් මුදලකට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට 2015 නොවැම්බර් 06 දින කොන්ත්‍රාත් පවරා තිබුණි. විගණන දිනය වූ 2021 ඔක්තෝබර් 07 දින වන විට කොන්ත්‍රාත්කරුවන් වෙත රු.39,278,021ක මුදලක් ගෙවා තිබුණද ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අතරමඟ නවතා දමා තිබීම හේතුවෙන් ළය චිකිත්සාගාරය කුලී පදනම මත පවත්වා ගෙන යාමට සිදුවී ඇති අතර විගණන දිනය වන විට රු.3,815,000 ක කුලී මුදලක් බදුකරු වෙත ගෙවා තිබුණි. | ඉදිරි වැඩ සඳහා දිස්ත්‍රික් ඉංජිනේරු වෙතින් රුපියල් විසිනව ලක්ෂයක ඇස්තමේන්තුවක් සකස් කර ඇති බව සහ බිම් මහළ ඉදිකිරීමට ඇස්තමේන්තුවක් සැකසීමට ගොඩනැගිලි ඉංජිනේරු කාර්යාලයට දැනුම් දී ඇති බව. | නිසි අධීක්ෂණයකින් යුතුව ඉදිකිරීම් කටයුතු සිදු කර ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වත්කම් කළමනාකරණය<br>---------------------------- | | |
| | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සතුව ගාල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි නිල නිවාස, නේවාසිකාගාර සහ කාමර 166 ක් පැවති අතර ඉන් 54 ක කිසිවකු පදිංචි නොමැති බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර, එහි වෛද්‍ය නිල නිවාස 71 න් 33 ක වෛද්‍යවරුන්ද, 16ක අනෙකුත් නිලධාරීන්ද, 22 ක කිසිවකු පදිංචි වී නොසිටිය බවත් හෙද නේවාසිකාගාර 21 න් 10 ක කිසිවකු පදිංචිවී නොමැති බවත් , ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථාන 67 න් පදිංචිව ඇත්තේ 48 ක පමණක් බවත්, වල්පල, මොරකැටිය, ඇල්ල ඉහල, සහ හෙළ කොල දෙණිය යන මධ්‍යස්ථාන 04 ක් අබලන්වීම නිසා භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතින බවත් නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණ පිළිගනු ලබන බවත් විගණනයෙන් පෙන්වා දෙනු ලැබූ කරුණු සම්බන්ධව විධිමත් තොරතුරු පද්ධතියක් සකස් කර ඒ අනුව අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව. | නිල නිවාස වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර භාවිතයට ගත නොහැකි නිවාස සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

1.5.4 ශීර්ෂය 307 - දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **ප්‍රසම්පාදනය**<br>-------------- | | |
| බෙලිඅත්ත ඖෂධ නිෂ්පාදනාගාරය සහ ආයුර්වේද රෝහල් සඳහා වියළි හා අමු ඖෂධ මිලදී ගැනීම සඳහා 2019, 2020 හා 2021 වර්ෂවල ලංසු කැඳවීමේදී වාර්ෂික අවශ්‍යතාවය පිළිබඳව සලකා බැලීමෙන් තොරව ඒකකයක මිල පමණක් සලකා බැලීම නිසා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (අ) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට උපරිම ආර්ථික වාසි ලබා ගැනීමට තිබුණු අවස්ථා අහිමි වී ගොස් තිබුණි. තවද ඉහත මාර්ගෝපදේශ 5.4.10(ඇ) සහ 5.3.13 (අ) (ii) වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත් මුදලින් සියයට 10 කට අඩු නොවන සුරක්ෂණයක් සහ කොන්ත්‍රාත් මුදලින් සියයට 0.5 සිට 1 දක්වා වූ එකවර ගෙවන මුදලක් සඳහා ඇප තැන්පතුවක් තැබිය යුතු වුවද එලෙස කටයුතුකොට නොතිබුණි. | 2022 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | වාර්ෂික සමස්ථ අවශ්‍යතාවය සලකා බලා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

1.5.5 ශීර්ෂය - 308 දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශය

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ගිණුම්කරණ අඩුපාඩු<br>------------------------ | | |
| (i) | මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පිරිවැය රු.38,510,007 ක් වූ හදිසි පාලම් සමාලෝචිත වර්ෂය අවසානය වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණද, අධිකාරිය එම පාලම් භාවිතා කරමින් පවතින අතර, ඒවා ප්‍රත්‍යාගණනය කොට ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම පාලම් 2022 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ප්‍රමිත අනුව අදාළ වත්කම් ප්‍රත්‍යාගණනය කොට ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | ගලගොඩ ඇස්පෝල්ට් අංගනයේ ඉතිරිවී තිබුණු ඇස්පෝල්ට් නිෂ්පාදන අමුද්‍රව්‍ය තොගය ඇල්පිටිය ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට ප්‍රවාහනය කිරීමේදී 299.63 m3 ක් අස්ථානගතවී තිබුණි. ඒ සම්බන්ධව වටිනාකම තහවුරු කරගෙන හෙළිදරව් කිරීමක් හෝ ගැලපීමක් අවසන් ගිණුම් තුළ සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විමර්ශන කටයුතු තවදුරටත් ක්‍රියාත්මක බැවින් ඒ සම්බන්ධව හෙළිදරව් කිරීමක් හෝ ගැලපීමක් අවසානයේ ගිණුම් තුළ සිදු නොකරන ලද බව. | මූල්‍ය ප්‍රකාශන තුළ අදාළ හෙළිදරව් කිරීම් හා ගැලපීම් නිවැරදිව සිදුකළ යුතුය. |
| (iii) | මාර්ග සංවර්ධන අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.508,546,192 ක් වූ ගිණුම් ශේෂ 12 ක් සම්බන්ධයෙන් ශේෂ තහවුරු කිරීම්, ශේෂවලට අදාළ විශ්ලේෂණ වාර්තා යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ශේෂ තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

(ආ) **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති, රීති , රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>II වන පරිච්ඡේදයේ 5.3.1 වගන්තිය | - | දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2021 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි කළමනාකරණ සහකාර III (තාක්ෂණික නොවන) තනතුරට තාවකාලික පදනම මත වසරක කාලයක් සඳහා එක් නිලධාරිණියක් සහ 2019 නොවැම්බර් 15 දින සිට අභ්‍යන්තර විගණන නිලධාරී තනතුරට තවත් නිලධාරිණියක් පත්කර තිබුණද ඒ සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කර නොතිබුණි. | ආණ්ඩුකාරවර නියෝගයට අනුව කටයුතු කර ඇති බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ සේවයට බඳවා ගැනීමේ පරිපාටියට අනුව කටයුතු කළයුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>-------------------- | | | | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | * 1997 පෙබරවාරි 03 දිනැති අංක 06/97 දරන චක්‍රලේඛය | - | වැඩබලන කාලය මාස 03 ක උපරිමයකට යටත් විය යුතු වුවත් මාර්ග සංවර්ධන අධිකාරියේ වර්ෂ 03 ක කාලයක සිට තනතුරු 08 ක් සඳහා වැඩ බැලීමේ පදනමින් නිලධාරීන් පත්කර තිබුණි. | වර්තමාන තත්ත්වය මසක් තුළ යොමු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | * 2016 දෙසැම්බර් 01 දිනැති අංක 28/2016 දරන චක්‍රලේඛයේ 03 ඡේදය | - | අදාළ සේවා ව්‍යවස්ථාව හා බඳවාගැනීම් පරිපාටිය සඳහා දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු සපයා නැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | 2015 මැයි 25 දිනැති අංක PED 1/ 2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | 284,589 | දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාට හා සාමාන්‍යාධිකාරීවරයාට චක්‍රලේඛ ප්‍රකාරව පිළිවෙලින් මාසයකට ඩීසල් ලීටර් 170 ක් හා 150 ක් පමණක් හිමිවිය යුතු වුවද එම ඉන්ධන සීමාවන් ඉක්මවා සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයේදී ඩීසල් ලීටර් 1722 ක් ද සාමාන්‍යාධිකාරීවරයා විසින් ඩීසල් ලීටර 1414 ක්ද පාවිච්චි කර තිබුණු අතර ඒ සඳහා පිළිවෙලින් රු.179,111 ක් සහ රු.105,478 ක් ගෙවීම් කර තිබුණි. | අතිරේක ඉන්ධන අවශ්‍යතාවය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සිදුකර ඇති බව. | |

(ඇ) අත්හැර දැමූ ව්‍යාපෘති
------------------------

| | | | |
|---|---|---|---|
| (i) | දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2017 වසරේ වැඩ ආරම්භකර එම වසර තුළම නිම කළ යුතු වූ කොන්ත්‍රාත් වටිනාකම රු.60,020,114 ක් වූ ව්‍යාපෘති 06 ක් වැඩ නිම නොකර අත්හැර දමා තිබුණි. | ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය සඳහා ආයතනයක් තෝරා ගැනීම ප්‍රමාද වූ බව. | අදාළ ව්‍යාපෘති නොපමාව නිමකර ගැනීමට හෝ කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | ගංවතුරෙන් හා නායයාම් වලින් හානියට පත්වූ මාර්ග පුනරුත්ථාපනය කිරීමට 2017 වර්ෂයේ මාකඳුර ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය ආරම්භකර තිබුණු ව්‍යාපෘති 13 ක් නිමකිරීම් කාලය පසුවී අවුරුදු 02 ත් 03 ත් අතර කාලයක් ගතවී තිබුණද නිමකර නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | අදාළ කාල පරිච්ඡේදය තුළ වැඩ නිම කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඈ) නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්
------------------------------------------

| | | |
|---|---|---|
| ගලගොඩ පෙරමුසු අංගනයේ පෙරමුසු නිෂ්පාදන කටයුතු 2018 ජූලි 09 දින සිට නතර කර දමා තිබුණු අතර පෙරමුසු නිෂ්පාදන යන්ත්‍රය 2021 මාර්තු මස වෙන්දේසි කර තිබුණි. නමුත් පෙරමුසු නිෂ්පාදනය සඳහා යොදවා ගැනීමේ අරමුණින් අංගනය වෙත සපයා තිබුණු නමුත් නිෂ්පාදනය සඳහා භාවිතා නොකළ රු.2,383,692 ක් වටිනා ගල් ඝන මීටර 931.13 ක් පෙරමුසු අංගනය තුළ ඉතිරිවී තිබුණද ඒවා අපහරණය කිරීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. | මෙම තත්ත්වයන් ඇති නොවීම සඳහා කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බව. | අදාළ ද්‍රව්‍ය වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට හෝ අදාළ සැපයුම්කරුවන් වෙත නැවත හරවා යැවීමට කටයුතු සිදු කළ යුතුය. |

1.5.6 ශීර්ෂය - 309 දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය<br>----------------------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>--------------------- | නිර්දේශය<br>---------- |
|---|---|---|
| මතභේදයට තුඩුදෙන ගණුදෙනු<br>----------------------------------- | | |
| අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අංක L/2940 දරන දීර්ඝ කාලීන බදුකරය යටතේ 1965 වර්ෂයේ සිට 1995 ජනවාරි 11 දින දක්වා අකුරැස්ස විවිධ සේවා සමුපකාර සමිතිය වෙත රජයේ ඉඩමක් ලබා දී තිබුණු අතර, 1995 වර්ෂයෙන් පසු විගණිත දිනය වූ 2022 මාර්තු 09 දින දක්වා එනම් වසර 26 ක් දක්වා දීර්ඝ කාලීන බදු ගිවිසුමක් නොමැතිව හා බදුකුලී ගෙවීමෙන් තොරව තවදුරටත් අනවසරයෙන් ඉඩම භුක්තිවිඳින බවත්, 1995 වර්ෂයේ සිට 2009 | බදු කාර්යය සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බවත් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ මාතර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කර ඇති බව. | දීර්ඝ කාලීන බදුකරය අනුව සහ රජයේ ඉඩම් පිළිබඳ කාර්ය සංග්‍රහයෙහි විධි විධාන අනුව කටයුතු කළ යුතුය. |

වර්ෂය දක්වා අය කළ යුතු දීර්ඝ කාලීන බදුකුලී එකතුව රු.5,230,000 ක් සහ 2010 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා නව තක්සේරු වාර්තා මත පදනම්වූ බදු කුලියත් අයකරගෙන නොතිබුණි. එමෙන්ම රජයේ ඉඩම් පිළිබඳ කාර්ය සංග්‍රහයේ ඉඩම් ආඥා පනතේ 454 වන අධිකාරියෙහි 229 නියෝගයෙහි 4 වන වගන්තිය ප්‍රකාරව රක්ෂිත ඉඩම්වල කවුරුන් වුවද පදිංචිවීම වලක්වාලිය යුතු අතර, සමුපකාර සමිතිය විසින් නිල්වලා ගඟ රක්ෂිතය තුළ පළමු මහලේ කොන්ක්‍රීට් තට්ටුව (Slab) දැමීම දක්වා වැඩ අවසන් කර ඇති ගොඩනැගිල්ලක් අනවසරයෙන් ඉදිකරමින් පැවතීම සම්බන්ධයෙන් 1979 අංක 07 දරන සන්තකය ආපසු ලබා ගැනීමේ පනත ප්‍රකාරව අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් විසින් කටයුතු කර නොතිබුණි.

1.5.7 <u>ශීර්ෂය - 310 දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව</u>

(අ) නීති, රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

| | නීති, රීති , රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | දකුණු පළාත් සභා මුල්‍යා රීති සංග්‍රහය | | | | |
| | රී .54 .5 | - | අලාභහානි සම්බන්ධව වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා පූර්ණ වාර්තාවක් යැවීමට දින 7 කට වඩා ගතවන්නේ නම් ප්‍රාරම්භක වාර්තාවක් යවා මාස 03 ක් ඇතුළත පූර්ණ වාර්තාවක් යැවිය යුතු වුවත්, කලේගාන නොවිධිමත් අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයේ තිබුණු පරිගණක යන්ත්‍ර 06 ක්, UPS – 06 ක් සහ Key board 06 ක් සොරුන් විසින් රැගෙන ගොස් 2021 දෙසැම්බර් 10 විගණන දිනට වසර 02 කුත් මාස 02 ක් ගතව තිබුණද, දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ප්‍රාරම්භක වාර්තාවක් හෝ පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | මේ පිළිබඳව සොයා බලා ඉදිරියේදී කටයුතු කරන බව.<br>අදාළ ලිපිනයන් වෙත ලිපි යවා ඇත. තවද ජාතික ඉතිරිකිරීමේ බැංකු වෙන්ද තොරතුරු ලබදෙන ලෙස ඉල්ලා ඇත. නැවත | මූල්‍යා රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.<br>චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 2011 නොවැම්බර් 24 දිනැති අංක 08/2011 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය | 413,747 | දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ බාලවයස්කාර ගිණුම් 87 ක් සම්බන්ධ තොරතුරු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යවා නොතිබුණි. ඒ අනුව බාලවයස්කරුවන්ට නිසි වයස සම්පූර්ණවී වසර 01 සිට 55 ක් ගතවුවද තැන්පතු ගිණුම්වල ඇති මුදල් හිමිකරුවන්ට ගෙවීමට අනුමැතිය ලබාගෙන මුදල් නිදහස් කර දීමට කටයුතු කර නොතිබුණි. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට තොරතුරු යැවීමට කටයුතු කරන බව. |

(ආ) **අධිකාර බලයකින් තොර ගෙවීම්**

-----------------------------------

| | | |
|---|---|---|
| කලේගාන නොවිධිමත් අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයේ සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 02 ක වැඩසටහන් පැවැත්වීමෙන් රු.5,154,700 ක ආදායමක් උපයාගෙන තිබුණු අතර, දකුණු පළාත් සභා මූල්‍ය රීති 39 ප්‍රකාරව පළාත් සභා ආදායම් ලෙස ගිණුම්ගත නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා ගෙන ඉන් රු.2,197,214 ක් නීත්‍යානුකූල නොවන ලෙස වියදම් කර තිබුණි. 2019 වර්ෂයට පෙර ඉපයූ ආදායම් පිළිබඳ විස්තර මධ්‍යස්ථානය සතුව නොතිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ රු.2,957,486 න් පැවතුණි. | 2019 ජූලි 15 දින සිට මුදල් අයකිරීමේ ක්‍රියාවලිය සඳහා විධිමත් රාමුවක් සැකසූ බවත් ඊට පෙර මුදල් අයකිරීමේ විධිමත් රාමුවක් සකස් කර නොමැති බව. | දකුණු පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ඇ) කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

| | | |
|---|---|---|
| 2008 සහ 2009 වර්ෂවල දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ඇති පාසල්වලට පාසල් මුරකරුවන් සහ රසායනාගාර සේවකයින් බඳවා ගැනීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි ඇමුණුම II හි පාද සටහන අනුව PL - I ට නියමිත වැටුප් පරිමාණයේ ආරම්භක පියවර වූ රු.11,730 ක වැටුප වෙනුවට PL - I වැටුප් පරිමාණයේ II ශ්‍රේණියට බඳවාගෙන එම වැටුප් පරිමාණයේ 12 වන පියවරෙහි තබා වැටුප් ගෙවා තිබුණි. නියැදි විගණන පරීක්ෂාවේදී ගාල්ල, ඇල්පිටිය, උඩුගම හා මාතර කලාපවල 88 දෙනෙකු එසේ බඳවා ගෙන වැඩි වැටුපක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලේකම්ගේ හා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපි අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව අදාල නිලධාරීන් නියමිත වැටුප් තලවල පිහිටුවීම සිදුකර 2016 පෙබරවාරි මස සිට වාරික 60 කින් එම මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතු බව දන්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඒ අනුව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ අනුව කටයුතු කරන ලෙස දන්වා ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ඇ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | | |
|---|---|---|
| අම්බලන්ගොඩ සහ ගාල්ල අධ්‍යාපන කලාපවල පාසල් ගොඩනැගිලි නිසිලෙස අධීක්ෂණය කර නඩත්තු නොකිරීම හේතුවෙන් පිළිවෙලින් පාසල් ගොඩනැගිලි 04 ක් සහ පාසල් 04 ක ගොඩනැගිලි කඩා ඉවත් කිරීමට ගොඩනැගිලි ඉංජිනේරුවරයා විසින් අනුමත කර තිබුණු අතර, ඉහත කලාප වල පිළිවෙලින් තවත් පාසල් ගොඩනැගිලි 09 ක් සහ 12 ක් බැගින් අවදානම් තත්ත්වයේ පැවතුණි. ගා/පැරැලිය ජිනරතන මහා විද්‍යාලයේ ඉදිකර තිබුණු 100 x 25 ප්‍රමාණයේ ගොඩනැගිල්ල 2004 සුනාමි ව්‍යවසනයෙන් පසු ඉදිකර තිබුණද දුර්වල ඉදිකිරීම් හේතුවෙන් වසර 16 ක පමණ කාලයකදී කඩා ඉවත් කිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව එම ගොඩනැගිලි කඩා ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉවත් කිරීමේ වියදම දැරීමට පාසල් සංවර්ධන සමිති ගිණුමේ මුදල් ප්‍රමාණවත් නොවීම, දක්ෂිණ නාවික විධාන මූලස්ථානය එකඟ වී තිබුණද එම කටයුතු සිදු නොවීම මත නැවත හික්කඩුව හා රත්ගම ප්‍රාදේශීය සභා වෙතින්ද ඉල්ලීම් සිදුකර ඇති බව. | අවදානම් සහිත ගොඩනැගිලි කඩා ඉවත් කිරීම සඳහා කඩිනමින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

(ඉ) දෘශ්‍ය අක්‍රමිකතා

| | | |
|---|---|---|
| දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් හෙක්ටයාර් 0.5535 ක් වූ කලේගාන සම්පත් මධ්‍යස්ථාන භූමියෙන් හෙක්ටයාර් 0.4654 ක් සම්පත් මධ්‍යස්ථානය සතුව පවතින අතර, හෙක්ටයාර් 0.0681 ක ප්‍රමාණයක් අනවසරකරුවන් 12 දෙනෙකු විසින් අත්පත් කරගෙන තාප්ප හා නිවාස ඉදිකර තිබුණද එම ඉඩම් අත්පත්කර ගැනීම සඳහා අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අවශ්‍ය කටයුතු කිරීම සඳහා ගාල්ල නාගරික කොමසාරිස් දැනුවත් කර ඇති බව. | අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන වත්කම් ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඊ) කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | | |
|---|---|---|
| අම්බලන්ගොඩ අධ්‍යාපන කලාපයේ ළඟම පාසල හොඳම පාසල වැඩසටහන යටතේ 2016 වර්ෂයේ නිම කළයුතු රු.5,397,602 ක ඉදිකිරීම් සහ අලුත්වැඩියා ව්‍යාපෘති 03 ක වැඩවලින් රු.3,495,250 ක වැඩ කොටස් පමණක් නිමකර අතහැර දමා තිබුණි. එම ඉදිකිරීම්වල යකඩ මලකෑමට ලක්වීමත් ගොඩනැගිලි දිරාපත්වීමත් සිදුවෙමින් පැවතුණි. | ව්‍යාපෘති 02 ක වැඩ කටයුතු සඳහා කල් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. තවත් ව්‍යාපෘතියක කටයුතු සිදු කිරීමට නව ඇස්තමේන්තුවක් ලබාදෙන ලෙස හෝ නැතහොත් ගිවිසුම අවලංගු කර දෙන ලෙස ඉල්ලීම් කර ඇති බව. | ව්‍යාපෘතිවල ප්‍රමාදයන් සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කර කඩිනමින් ව්‍යාපෘති අවසන් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | දොඩන්දූව ගා/රෝහණ මහා විද්‍යාලයේ ඉදිකරන ලද තාක්ෂණ විද්‍යාගාරය 2016 වර්ෂයේ විවෘත කර තිබුණද, විද්‍යාගාර ගොඩනැගිල්ලට අවශ්‍ය විද්‍යාගාර උපකරණ ලබා නොදීමෙන් විද්‍යාගාර ගොඩනැගිල්ල නිෂ්ක්‍රීයව පැවතුණි. | අවශ්‍ය ලී බඩු හා උපකරණ, ලබාදෙන ලෙස රේඛීය අමාත්‍යාංශයට ලිඛිතව අවස්ථා 02 කදී දැනුම් දුන්නද, භාණ්ඩ මෙතෙක් ලැබී නොමැත. එබැවින් එම පරිශ්‍රය වෙනත් කාර්යයන් සඳහා භාවිතා කරන බව. | සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. |

1.5.8 <u>ශීර්ෂය - 311 දකුණු පළාත් ධීවර, සත්ත්ව නිෂ්පාදන සහ සංවර්ධන, පරිසර කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය</u>

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ----------------------- | --------- |
| ආර්ථික නොවූ ගණුදෙනු<br>---------------------------- | | |
| දකුණු පළාත් ධීවර අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ එකතු කරන ලද ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනුවෙන් රු.3,564,365 ක මුදලක් පෞද්ගලික සමාගම් දෙකක් වෙත ගෙවා තිබුණද, එම අපද්‍රව්‍ය එකතු කළ ආකාරය, ලබාදුන් අයගේ නම්, ලබාදුන් ප්‍රමාණය සහ අපහරණය කිරීම සඳහා පෞද්ගලික සමාගම් වෙත භාරදුන් ප්‍රමාණය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2015/2016 අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩසටහන යටතේ ප්‍රාදේශීය සභාව මගින් අපද්‍රව්‍යය එකතු කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කල බවත්, ඒ අනුව එකතු වූ අපද්‍රව්‍ය පරිසර අමාත්‍යාංශයට ලබා දෙන ලද බවත් අධික තොග ප්‍රමාණයක් වෙන් කිරීමකින් තොරව පැවතීමෙන් ඒවායේ ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු අමාත්‍යාංශය සතුව නොමැති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කර ඊට අදාළ තොරතුරු නිවැරදිව ලේඛනගත කර පවත්වා ගත යුතුය. |

1.5.9 <u>ශීර්ෂය - 313 දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව</u>

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ----------------------------- | ---------- |
| **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු** | | |
| පේෂ හා කුඩා කර්මාන්ත අත්තිකාරම් ගිණුමේ (විෂයය අංක 31302) බලය දෙනු ලැබූ වියදමෙහි උපරිම සීමාව රු.260,000,000 ක් වුවද වියදමෙහි තථ්‍ය අගය රු.294,732,883 ක් වූයෙන් වියදමෙහි උපරිම සීමාව රු.34,732,883 කින් ඉක්මවා තිබුණි. | විගණනයේ නිරීක්ෂණ පිළිගනිමි. සීමාවන් උල්ලංඝනය කර ඇති අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු දැනුවත් කිරීමට කටයුතු කරන බව. | සීමා ඉක්මවා යාමට පෙර අවශ්‍ය සංශෝධනයන් සිදු කර ගෙන නියමිත අධිකාරී බලය සහිතව වියදම් දැරිය යුතුය. |

1.5.10 <u>ශීර්ෂය - 315 දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව</u>

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | -------------------------- | ---------- |
| (අ) | **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු** | | |
| (i) | ලබුදූව ගොවිපල අත්තිකාරම් ගිණුමේ (විෂයය අංක 31503) බලය දෙනු ලැබූ හර ශේෂයේ උපරිම සීමාව රු.28,000,000 ක් වුවද හර ශේෂයෙහි තථ්‍ය අගය රු.50,558,433 ක් වූයෙන් හර ශේෂයෙහි උපරිම සීමාව රු.22,558,433 කින් ඉක්මවා තිබුණි. | විගණනයේ නිරීක්ෂණ පිළිගනිමි. සීමාවන් උල්ලංඝනය කර ඇති අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු දැනුවත් කිරීමට කටයුතු කරන බව. | සීමා ඉක්මවා යාමට පෙර අවශ්‍ය සංශෝධනයන් සිදුකර ගෙන නියමිත අධිකාරී බලය සහිතව වැය දැරිය යුතුය. |
| (ii) | හම්බන්තොට රුහුණු රසාර අලෙවිසැල අත්තිකාරම් ගිණුමේ (විෂයය අංක 31506) බලය දෙනු ලැබූ හර ශේෂයේ උපරිම සීමාව රු.900,000 ක් වුවද හර ශේෂයෙහි තථ්‍ය අගය රු.1,431,317 ක් වූයෙන් හර ශේෂයෙහි උපරිම සීමාව රු.531,317 කින් ඉක්මවා තිබුණි. | විගණනයේ නිරීක්ෂණ පිළිගනිමි. සීමාවන් උල්ලංඝනය කර ඇති අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු දැනුවත් කිරීමට කටයුතු කරන බව. | සීමා ඉක්මවා යාමට පෙර අවශ්‍ය සංශෝධනයන් සිදුකර ගෙන නියමිත අධිකාරී බලය සහිතව වැය දැරිය යුතුය. |

(ආ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| | | |
|---|---|---|
| දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් තලිජ්ජවිල දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය තුළ වටිනාකම රු.1,314,300 ක් වූ විජලන යන්ත්‍රය, අත්ට්‍රැක්ටරය, CCTV කැමරා 08 ක්, සුදු පොල්තෙල් යන්ත්‍රය හා පොල් මිරිකීමේ යන්ත්‍රය 2021 දෙසැම්බර් 31 විගණිත දිනය වන විටත් අභාවිතව පැවතුණි. | CCTV කැමරා අළුත්වැඩියාව සඳහා ප්‍රතිපාදන නොමැති බවත් සුදු පොල් තෙල් යන්ත්‍රය පරීක්ෂා කර වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරන බවත් පොල් මිරිකීමේ යන්ත්‍රය සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය කඩිනමින් ලබා ගන්නා බව. | උපකරණ මිලදී ගැනීමේදී අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගෙන මිලදී ගැනීම කළ යුතුය. එසේම නිශ්ක්‍රීය වත්කම් කඩිනමින් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළයුතුය. |

1.5.11 <u>ශීර්ෂය - 317 දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව</u>

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ අකාර්යක්ෂමතා | | |
| (i) | 2012 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන රු.14,328,127 ක් වූ උසාවි දඩ මුදල්, අදාළ සමිති හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් නොකරන ලද උසාවි දඩ මුදල් නිරවුල් කරන තුරු අරමුදල තුළ පවත්වාගෙන යාමටත් හඳුනාගත් පාර්ශවයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ විට අදාළ මුදල් නිදහස් කිරීමටත් අරමුදල් කළමනාකරණ කමිටුව විසින් තීරණය කර ඇති බව. | උසාවි දඩ මුදල් නිරවුල් කිරීම සඳහා කඩිනමින් ක්‍රමවේදයක් සකස්කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුපකාර සමිතිවලින් අයවිය යුතු භාණ්ඩාගාර අරමුදලේ ණය ශේෂය වූ රු.30,808,369 ක් සඳහා පොලී මුදල රු.14,696,666 ක් වූ අතර මෙම ණය හා පොලී ශේෂයන් 2006 වර්ෂයේ සිට පැවතියද අදාළ සමිතිවලින් අයකර ගැනීමට හෝ ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ණය සම්බන්ධව ණය ගිවිසුම් හා නීත්‍යානුකූල ලේඛන ඉදිරිපත් කරන ලෙස 2014 වර්ෂයේ සිට ඉල්ලීම් කළද තොරතුරු ලබා දී නොමැති බව. | පසු විපරම් ක්‍රියාවලිය කාලීනව හා නිසි අධීක්ෂණයකින් යුක්තව සිදු කර අයවිය යුතු ණය ශේෂ අය කර ගැනීමට හෝ නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | වර්ෂ 1994 සිට 2020 දක්වා කාලය තුළ සමුපකාර සමිති 18 ක් සඳහා විවිධ කාර්යයන් වෙනුවෙන් ලබාදී තිබුණු එකතුව රු.45,418,396 ක් වූ ණය මුදල් වලින් 2021 නොවැම්බර් 30 දින වන විට එකතුව රු.23,695,696 ක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි. | ආණ්ඩුකාරවර සමග සාකච්ඡා කර පොලී සහන ලබා දී අයකර ගැනීමට උත්සහ ගනිමින් පවතින අතර නැතහොත් කපා හැරීමට කටයුතු කරන බව. | පසු විපරම් ක්‍රියාවලිය කාලීනව හා නිසි අධීක්ෂණයකින් යුක්තව සිදු කර අයවිය යුතු ණය ශේෂ අය කර ගැනීමට හෝ නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2021 වර්ෂයේදී සමුපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදලේ උපදේශක කාරක සභාවේ සභාපති ඇතුළු සාමාජිකයින් 06 දෙනෙකුට විශ්‍රාම වැටුප් අරමුදලෙන් දීමනා ලෙස ගෙවීමේ හැකියාවක් නොතිබියදී ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත රු.326,000 ක් ද කාර්යමණ්ඩලයේ නිලධාරීන් 08 දෙනෙක් සඳහා රු.878,139 ක් ද වශයෙන් රු.1,204,139 ක් ගෙවා තිබුණි. | නියෝග මාලාව අනුව ප්‍රතිපාදන වෙන් කිරීමට සිදු නොවන නමුත් නියෝග මාලාවේ 27 වන වගන්තිය හා 2020.10.27 දිනැති ආණ්ඩුකාර තුමාගේ ලිපිය මඟින් උපදේශක කාරක සභාව හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත ගෙවීම් සිදු කර ඇති බව. | සමුපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදලේ නියෝග මාලාවට අනුව කටයුතු කළ යුතුය. |

(ආ) මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

| | | | |
|---|---|---|---|
| (i) | දකුණු පළාත් සමුපකාර දෙපාර්තමේන්තුව විසින් 2005 වර්ෂයටත් පෙර සිට සමුපකාර භාරකාර අරමුදල නමින් පවත්වාගෙන ගොස් තිබුණු අතිරික්ත අරමුදල මගින් සමුපකාර සමිති 07 ක් වෙත ලබාදී තිබුණු එකතුව රු.6,383,765 ක ණය ශේෂ අයකර ගැනීමට මේ දක්වාම කටයුතු කර නොතිබුණි. ඉන් එක් සමිතියක් හැර අනිකුත් සමිති 06 හි ණය ශේෂ 2005 වර්ෂයේ සිට හිඟව පැවතියද එකී ණය ශේෂ අයකර ගැනීමට හෝ ඊට අදාළ නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම්ගත කාලය තුළ අයකර නොමැති සහ ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග එම කාල වකවානුව තුළ ගෙන නොමැති බැවින් අයකර ගැනීම අසීරු තත්ත්වයකි. නැවත ගිවිසුම්ගත වෙමින් ණය අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ණය ශේෂ කඩිනමින් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ii) | මාතර දිස්ත්‍රික්කයේ උසාවි දඩ මගින් අයකර එවනු ලබන මුදල් අදාළ සමුපකාර සමිති හඳුනාගෙන නොපමාව එම සමිති වෙත ලබාදීම කළ යුතු වුවත් 2018, 2019 හා 2020 වර්ෂවල හඳුනා නොගත් රු.899,761 ක් හා 2017 වර්ෂයට පෙර එලෙස හඳුනා නොගත් රු.2,175,665 ක ශේෂයක් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ පැවතුණි. | හඳුනාගත නොහැකි උසාවි දඩ මුදල් හඳුනා ගැනීමට අදාළ තොරතුරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත සහ සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී වෙත යොමු කර ඇත. ඔවුන් මඟින් හඳුනාගත් වහාම නිරවුල් කිරීමට කටයුතු කරන බව. | අදාළ සමිති හඳුනා ගෙන නිරවුල් නොකරන ලද උසාවි දඩ මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

1.5.12 ශීර්ෂය - 318 දකුණු පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, ග්‍රාම සංවර්ධන සංස්කෘතික හා කලා කටයුතු, සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු හා ගෘහ ආර්ථික ප්‍රවර්ධන, නිවාස හා ඉදිකිරීම් , මිනිස්බල හා රැකී රක්ෂා අමාත්‍යාංශය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | කළමනාකරණ අකාර්යක්ෂමතා | | |
| (අ) | රජයේ මුදල් අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කිරීමේ අවශ්‍යතාවය දැඩි ලෙස රජය විසින් අවධාරණය කර තිබියදී අර්ථාන්විත ගීත පිළිබඳ ජනතාව තුළ ඇල්මක් ඇති කිරීමේ අරමුණින් ආගමික, සාහිත්‍ය හා කලා සංවර්ධන අරමුදලින් ගීත දහසයකින් යුතු ගීත තැටියක් නිර්මාණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට එකතුව රු.1,427,500 ක වියදමක් දරා තිබුණි. ව්‍යාපෘති වාර්තාව අනුව 2020 ඔක්තෝබර් මස ගීත තැටිය එළිදැක්වීමට නියමිතව තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම එම ගීත තැටිය එළිදැක්වීමට කටයුතු කර නොතිබුණි. | ගී තැටියේ ඇතුළත් ගීත දක්ෂිණපාය පරිශ්‍රයේ උදෑසන කාලයේ ප්‍රචාරය කිරීම මගින් ගීතවලට ප්‍රසිද්ධියක් ලබා ගැනීම, රුහුණු සේවය මගින් ගීත ප්‍රචාරය කරවා ගැනීම අපේක්ෂාව බවත් දකුණු පළාත් රාජ්‍ය සංගීත කණ්ඩායම සහභාගී වන ප්‍රසංගයන්හි මෙම ගීත ගායනා කිරීම මගින් එම ගීත ජනගත කිරීමට බලාපොරොත්තු වන බව. | රජයේ අරමුදල් ඵලදායි ව්‍යාපෘති සඳහා යෙදවිය යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට 1999 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ග්‍රාම සංවර්ධන අරමුදල මගින් ලබා දී තිබුණු ණය මුදල් වලින් ණය හා පොලී ලෙස රු.16,011,413 ක හිඟ ශේෂයක් අයවීමට පැවතුණි. | තවදුරටත් 1999 – 2019 වර්ෂවලට අදාළ ණය සහ පොළී ශේෂය රු.16,011,413ක් පවතින බව. | කඩිනමින් හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

1.5.13 ශීර්ෂය - 320 දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු ගිණුම් | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.1,334,237,399 ක් ජංගම වත්කම් ලෙස දක්වා තිබුණු අතර එම ශේෂයට | නිරීක්ෂණ පිළිගනිමි. මෙම ණය ශේෂ නිරවුල් කිරීම් කටයුතු ආයතන මගින් සිදුවෙමින් පවතින බව. | මෙම ණය ශේෂ නිරවුල් කිරීමේ කටයුතු ආයතන මගින් සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගිය හා මිය ගිය, වැඩ තහනම් කළ හා සේවය හැරගිය නිලධාරීන් 4,479 දෙනෙකුගෙන් තවදුරටත් අයවිය යුතු එකතුව රු.96,390,494 ක් වූ අය නොවන ණය ශේෂ ඇතුළත්ව තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

-------------------

| | | |
|---|---|---|
| දකුණු පළාත් සභාව විසින් පළාත් පාලන ආයතන 49 කට සමාලෝචිත වර්ෂය අවසානයේදී ගෙවිය යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් වටිනාකම රු.237,281,085 ක් වුවද මුද්දර ගාස්තු හා උසාවි දඩ වලට අදාළ ආදායම් මුදල් පොත අනුව පැවති මුදල් ශේෂය රු.13,106,654 ක් විය. ඒ අනුව මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදලක් මුදල් පොතේ නොමැති බවත් මුද්දර ගාස්තු හා උසාවි දඩ වෙනුවෙන් ලද මුදල් වෙනත් කටයුතු සඳහා වියදම් කර ඇති බවත් නිරීක්ෂණය විය. | මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් සඳහා වෙනම මුදල් පොතක් පවත්වා ගන්නේ අභ්‍යන්තර පාලනය සඳහාය. මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් වලට අදාළ සියලු මුදල් එහි පෙන්නුම් නොකරන බව. | මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් සඳහා පවත්වා ගනු ලබන මුදල් පොත තුළ මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් වලට අදාළ සියලු මුදල් ඇතුළත් විය යුතුය. |

(ඇ)

**ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**

------------------------------------------------------------

| | | |
|---|---|---|
| පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් 21 කට අදාළ වියදමේ උපරිම සීමා ඉක්මවා තිබුණු අවස්ථා 10 ක්, හර ශේෂයේ උපරිම සීමාව ඉක්මවා තිබුණු අවස්ථා 06 ක් හා ලැබීම්වල අවම සීමාවට ලඟා වී නොතිබුණු අවස්ථා 05 ක් නිරීක්ෂණය විය. | පළාත් රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් සඳහා අදාළ සීමා අනුව කටයුතු කිරීම එම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් සිදු කළ යුතුය. සීමා ඉක්මවීම සහ සීමාවට ළඟා නොවීම පිළිබඳව අදාළ ආයතන දැනුවත් කිරීමට කටයුතු කල බව. | පනවාගත් සීමා තුළ කටයුතු කිරීමට හෝ සීමා ඉක්මවීමක් සිදුවන්නේ නම් අවශ්‍ය සීමා සංශෝධනයන් සිදුකරවා ගත යුතුය. |

(ඈ) ආර්ථික නොවූ ගණුදෙනු

----------------------------

දකුණු පළාත් සභාව සඳහා තැපැල කළමනාකරණ තොරතුරු පද්ධතියක් සකස්කරවා ගැනීම.

-----------------------------------------

| | | |
|---|---|---|
| දකුණු පළාතේ සියලුම රාජ්‍ය ආයතන ඒකාබද්ධ කර තැපැල කළමනාකරණ පරිගණක වැඩසටහනක් නිර්මාණය කිරීම සඳහා 2020 ඔක්තෝබර් මස 07 දින රු.14,008,176 ක මුදලකට | මෙවැනි වැඩසටහනක් සකස් කරවා ගැනීම සඳහා පදනම් වූයේ කඩදාසි භාවිත නොකරන (Paper less) රාජ්‍ය සේවයක් ඇති කිරීම වන අතර, මෙය ගරු | මේ සම්බන්ධව අධ්‍යයනයක් සිදු කර අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගත |

| | | |
|---|---|---|
| කොන්ත්‍රාත් සමාගමක් සමඟ ගිවිසුම්ගත වී තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂය තුළදී රු.27,984,663 ක මුදලක් වැයකර තිබුණි. කොන්ත්‍රාත්තුව 2020 ඔක්තෝබර් 07 දින සිට මාස 03 ක් ඇතුළත අදියර 03 කින් ස්ථාපනය කිරීම සඳහා ගිවිසුම්ගත වුවද, 2022 ජුනි මස දක්වාම පද්ධතියේ පළමු අධියරේ වැඩ කොටස් පමණක් සංවර්ධනය කරමින් පැවතුණු අතර, ඒ ඒ අදියර වල සාර්ථකත්වය මත ඊළඟ අදියර ක්‍රියාත්මක කිරීම අපේක්ෂාකර තිබුණත් එම අදියර තුන සඳහාම අවශ්‍ය වන ස්කැනර් යන්ත්‍ර 86 ක් රු.21,140,000 කට මිලට ගෙන ස්කැනර් යන්ත්‍ර 16 ක් පමණක් පද්ධතිය ස්ථාපිත කරනු ලබන ආයතනවලට බෙදාහැර රු.14,700,000 ක් වටිනා ස්කැනර් යන්ත්‍ර 70 ක් ගබඩාවේ රඳවාගෙන තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම නිශ්කාර්යව පැවතුණි. | ආණ්ඩුකාරතුමාගේ අදහසක් අනුව ක්‍රියාත්මක කරන ලද බව හා ප්‍රසම්පාදනය තුළින් එකවර මිලදී ගැනීමේදී වාසි ලබාගැනීමේ අරමුණින් කටයුතු කළ බව. | යුතුය. |

(ඉ) හඳුනාගන්නා ලද පාඩු

-----------------------

| | | |
|---|---|---|
| දකුණු පළාත් සභාවේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හා කාර්යාල වලට අයත් නොවිසඳී පවතින අවස්ථා 24 කට අදාළ රු.21,747,894 ක වාහන අනතුරු සම්බන්ධ හානි සහ අවස්ථා 54 කට අදාළ රු.6,725,303 ක දේපළ හානි වශයෙන් එකතුව රු.28,473,197 ක හානි පවතින බව නිරීක්ෂණය විය. | නිරන්තරයෙන් මේ පිළිබඳ සාකච්ඡා කර ක්‍රියාකිරීමට කටයුතු කරන බව. | දකුණු පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.5.14 ශීර්ෂය - 322 දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ------------------------- | ----------- |
| (අ) කළමනාකරණ අකාර්යක්ෂමතා<br>----------------------------------- | | |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ සැලසුම් අංශයේ නිර්මාණ ඉංජිනේරු තනතුරේ සේවය කරනු ලබන නිලධාරියෙකු 2020 සැප්තැම්බර් 04 දිනැති දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලිපිය පරිදි 2020 සැප්තැම්බර් මස 04 දින සිට සතියට දින 02 ක් එනම්, | උක්ත ඉංජිනේරුවරයා ස්ථිර ලෙසට 2022 මාර්තු මස සිට ගාල්ල මහනගර සභාවේ නාගරික ඉංජිනේරු තනතුරට පත්කර නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) | අදාල නිලධාරියා සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අඟහරුවාදා හා බ්‍රහස්පතින්දා දින වල ගාල්ල මහනගර සභාවේ නාගරික ඉංජිනේරු තනතුරේ වැඩ බැලීම සඳහා නිත්‍ය තනතුරට අමතරව පත්කර තිබුණ මුත් නිලධාරියා සිය අභිමතය පරිදි 2021 පෙබරවාරි මස සිට 2022 මාර්තු දක්වා පූර්ණකාලීනව වැඩබැලීමේ තනතුරේ කටයුතු කර තිබුණි. | වෙතද පිටපත් සහිතව දකුණු පළාත් ප්‍රධාන ලේකම් මගින් එම මහතා වෙත ලිපියක් නිකුත් කර ඇති බව. | |
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු<br>------------------------------------- | | |
| (i) | වඳුරඹ මධ්‍ය මහා විද්‍යාලයේ පුස්තකාලය සහිත තාක්ෂණික විද්‍යාගාරය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමඟ රු.17,057,534 ක ගිවිසුමකට එළඹ 2021 දෙසැම්බර් 31 වන විට රු.11,579,747 ක් ගෙවා තිබුණි. 2017 නොවැම්බර් 05 දින ඉදිකිරීම් අවසන් කළ යුතුව තිබුණ ද කොන්ත්‍රාත් සමාගම විසින් කොන්ත්‍රාත්තුව අත්හැර දමා තිබුණි. අත්තිකාරම් සඳහා වූ ඇපකරය 2019 මාර්තු 19 දින කල් ඉකුත්වී තිබුණද, එහි කාලය දීර්ඝ කරගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව රු.1,103,874 ක අත්තිකාරම් මුදල් අයකරගැනීමට නොහැකිවී තිබුණි. පළමු මහල සඳහා කොන්ක්‍රීට් තට්ටුවේ එළා තිබුණු බට පද්ධතියෙහි කොන්ක්‍රීට් අවහිර වී ප්‍රයෝජනයට ගත නොහැකි වීම, විදුලි පරිපථ සඳහා කපරාරු නොකළ බිත්ති මත කේසින් සවිකිරීම සහ ඇලුමිනියම් ජනෙල් පට්ටම් සවිකර තිබීම වහල සඳහා යොදන ලද කාප්පවල නිසිපරිදි තීන්ත ආලේප කිරීමද සිදුකර නොතිබුණි. | දිස්ත්‍රික් ඉංජිනේරු උපදෙස් රහිතව කේසින් යොදා විදුලි පරිපථ සකස් කිරීම නිසා විදුලි පරිපථ ඇදීම සඳහා ගෙවීම් කර නොමැත. මෙම අඩුපාඩු ඇතුළු තවත් අඩුපාඩු කිහිපයක් නිරීක්ෂණය කර සකස් කිරීමට කොන්ත්‍රාත්කරුට උපදෙස් දෙන ලද බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කර ගිවිසුම්ගත පරිදි අදාළ කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | ගා/ක්‍රිස්තුදේව බාලිකා විද්‍යාලයේ පරිගණක විද්‍යාගාරය සහ පුස්තකාලය සහිත 90′X25′ තෙමහල් පන්ති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2017 මැයි 02 දින කොන්ත්‍රාත්කරු සමඟ රු.19,793,490 කට ගිවිසුම් ගතවී රු.8,333,110 ක මුදලක් ගෙවා තිබුණි. ගිවිසුම පරිදි 2018 මැයි 01 දිනෙන් කොන්ත්‍රාත්තුවේ වලංගු කාලය ඉක්ම ගොස් තිබුණි. ඉදිකිරීම් කටයුතු නවතා දැමීම සහ ඉදිකිරීම්වල ප්‍රමිතිය දුර්වල මට්ටමක පැවතීම හේතුවෙන් 2019 සැප්තැම්බර් 11 දින ගිවිසුම අවලංගු කිරීම සඳහා දිස්ත්‍රික් ඉංජිනේරු විසින් දැනුම් දී තිබුණි. කොන්ත්‍රාත්කරුට ලබාදී තිබුණු රු.5,695,647 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලින් තවදුරටත් අයවිය යුතු මුදල රු.4,426,435 ක් වුවද කොන්ත්‍රාත්තුව කඩිනමින් නිමකර එම මුදල් අයකර ගැනීමට හෝ ඊට අදාළ බැංකු ඇපකරයේ කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් මේ සම්බන්ධයෙන් විමසීම් කර ඇති අතර කොන්ත්‍රාත්තුව අවසන් කර ඉතිරි වැඩ වෙනත් කොන්ත්‍රාත්කරුවකු ලවා ඉටුකර ගැනීමට තීරණය කල බව. | අයවිය යුතු අත්තිකාරම් මුදල කඩිනමින් අයකර ගත යුතු අතර, ගිවිසුම අවලංගු කර අදාළ කොන්ත්‍රාත්කරු අසාදු ලේඛනගත කර ඉතිරි වැඩ වෙනත් කොන්ත්‍රාත්කරුවකු ලවා කඩිනමින් ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. වගකිවයුතු පාර්ශවයන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

ගිවිසුම පරිදි තවදුරටත් ඉටුකළයුතු වැඩ කොටස්වල ඇස්තමේන්තු වටිනාකම රු.17,652,447 ක් වුවද කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් අත්හැර තිබීම මත ඉතිරිවැඩ වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු ලවා ඉටුකරවා ගැනීමට රු.29,109,837 ක ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් පරිපාලනයේ අසාර්ථකත්වය මත රජයට රු.11,457,390 ක අමතර මුදලක් දැරීමට සිදුවී තිබුණි.

1.5.15 <u>ශීර්ෂය - 324 දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුව</u>

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) හිඟ ආදායම් | | |
| ඉඩම් පැවරීම මත අයකරනු ලබන මුද්දර ගාස්තු වලට අදාල ඉඩම් නැවත තක්සේරු කර ලබාදෙනු ලබන මත ප්‍රකාශන අනුව ණයගැතියන් 9581 දෙනෙකු එකඟ වූ හිඟ මුද්දර ගාස්තු ආදායම 2021 දෙසැම්බර් 31 දිනට රු.436,862,186 ක් බව නිරීක්ෂණ විය. පළාත් මුල්‍ය රීති 116.1 ප්‍රකාරව නීති මාර්ගයෙන් හිඟ මුදල් අයකර ගැනීමට හෝ අයකර ගැනීමට නොහැකි නම් අත්හැර දැමීමට කටයුතු කළ යුතු වුවද එසේ ක්‍රියාකර නොතිබුණි. | හිඟ ආදායම් (මුද්දර ගාස්තු වලට අදාළව) ඉදිරි වර්ෂ වලදී අයකර ගැනීමට කටයුතු කරන බව. | නියමිත ආදායම් කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) මෙහෙයුම් අකාර්යක්ෂමතා | | |
| දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ගාල්ල දිස්ත්‍රික්කය තුළ 2021 වර්ෂයේ ඉඩම් පැවරීම මත පැනවෙන මුද්දර ගාස්තු අය කිරීම් පිළිබඳව 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තියේ 03 වන කොටසේ xxiv පරිච්ඡේදය අනුව පළාත් තක්සේරුකරුවකු විසින් අදාළ ඉඩම් පිළිබඳ කරනු ලබන තක්සේරුවකින් අනතුරුව ලබාදෙනු ලබන "මත ප්‍රකාශය" පිළිබඳ අතෘප්තියට පත් තැනැත්තකු එවන ලද අභියාචනා පිළිබඳ කරන ලද විගණන පරීක්ෂාවේදී රු.19,868,501 ක මුද්දර ගාස්තු සහ රු.8,260,218 ක දඩ ගෙවිය යුතු තැනැත්තන් 325 දෙනෙකු විසින් ඉදිරිපත් කර තිබුණු අභියාචනා විභාග කිරීමෙන් පසු රු.8,883,100 දක්වා | අභියාචනා සම්බන්ධ ස්ථාන පරීක්ෂාවක් මඟින් අනාවරණය වන කරුණු සලකා බලා සංශෝධනය සිදු වන බවත් ඒ හේතුවෙන් පෙර තිබූ මුද්දර ගාස්තුව හා දඩ මුදල් අඩු වීම සිදුවන බවත් අභියාචනා කිරීම ප්‍රඥප්තියෙන් බඳු ගෙවන්නාට ඇති අයිතියක් බව. | "මත ප්‍රකාශ" මඟින් ලබාදෙන තක්සේරු අගයයන් සහ අභියාචනා විභාග කිරීමෙන් පසු ලබාදෙන අගයයන් අතර අසාමාන්‍ය විචලනයක් නොවිය යුතුය. එම අගයයන් වෙනස් වන්නේ නම් විධිමත් ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

මුද්දර ගාස්තුද රු.1,199,722 දක්වා මුද්දර ගාස්තු සඳහා පනවන ලද දඩයද අඩුකර තිබුණි. ඒ අනුව මත ප්‍රකාශන සදොස්ව සිදුකර ඇති බව නිරීක්ෂණය විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.558,915,389 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ නැවත ගලපන ලද ඌනතාවය රු.1,654,409,455 ක් විය. සමාලෝචිත වර්ෂයේ වියදමට සාපේක්ෂව ආදායම් හා ප්‍රදාන වැඩිවීම නිසා ඉකුත් වසරේ ඌනතාවය ඉක්මවා සමාලෝචිත වර්ෂයේ අතිරික්තයක් ඇතිවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 රජයේ ප්‍රදාන

| මූලාශ්‍රය | අනුමත මුදල | වැයකළ මුදල | ඌන උපයෝජනය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) | 2,569,000,000 | 1,349,925,500 | 1,219,074,500 |
| උපමාන පාදක ප්‍රදාන (CBG) | 515,000,000 | 271,925,500 | 243,074,500 |
| පොදු අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති (TSET) | 220,000,000 | 209,036,281 | 10,963,719 |
| ප්‍රාථමික සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීමේ ව්‍යාපෘති (PSSP) | 330,000,000 | 329,467,663 | 532,337 |
| එකතුව | 3,634,000,000 | 2,160,354,944 | 1,473,645,056 |

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------ | ---------- |
| ඉහත විග්‍රහ කර ඇති පරිදි පළාත් සංවර්ධන කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා අනුමත රු.3,634,000,000 ක ප්‍රතිපාදනවලින් රු. 1,473,645,056 ක් හෙවත් සියයට 40 ක සැලකිය යුතු ප්‍රතිශතයක් උපයෝජනය කර නොතිබුණි. | අක්මුදල් නිකුත් කිරීම ප්‍රමාණවත් නොවූ නිසා මෙම තත්ත්වය වර්ෂ කිහිපයක සිට දිගින් දිගටම සිදු වූ බවත් එම නිසා මෙහෙයුම් කටයුතු වල සඵලදායීත්වය අඩු වීමට හේතු වූ බව. | අනුමත ප්‍රතිපාදන වලින් උපරිම ප්‍රතිශතයක් උපයෝජනය කළ යුතුය. |

**3.1.2 පළාත් සංවර්ධන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ සහ අවිච්ඡේද වැඩ වෙනුවෙන් රු.මිලියන 3,940 ක ඇස්තමේන්තු වටිනාකමට වූ යෝජනා 2505 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව වැඩ යෝජනාවල ප්‍රගතිය පහත පරිදි විය.

| | විස්තරය | නව වැඩ යෝජනා ගණන | අවිච්ඡේද වැඩ යෝජනා ගණන | මුළු වැඩ යෝජනා ගණන | මුළු වැඩවල ඇස්තමේන්තු වටිනාකම රු.මි. |
|---|---|---|---|---|---|
| (අ) | සම්පූර්ණයෙන් නිමකළ | 1705 | 24 | 1729 | 2028 |
| (ආ) | සියයට 50 කට වඩා අඩුවෙන් නිමකළ | 265 | 0 | 265 | 667 |
| (ඇ) | සියයට 50 කට වඩා වැඩියෙන් නිමකළ | 334 | 0 | 334 | 1018 |
| (ඈ) | ආරම්භ කර නොතිබූ | 177 | 0 | 177 | 227 |
| | එකතුව | 2481 | 24 | 2505 | 3940 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | --------------------- | ---------- |
| (i) | වැඩ යෝජනා 776 ක් අමාත්‍යාංශ මට්ටමින් අවසන් කිරීමට පැවතීමෙන් ඒ ඒ අමාත්‍යාංශ මගින් එකී වැඩ යෝජනා සම්බන්ධ පසු විපරම් කටයුතු විධිමත් පරිදි සිදුවී නොතිබුණු අතර, ව්‍යාපෘති වලින් බලාපොරොත්තු වූ අරමුණු ඉටුවී ඇද්ද යන්න පිළිබඳව කාර්යසාධන දර්ශක හඳුනාගෙන ඒ තුළින් ඇගයීම් සිදුකර නොතිබුණි. ඒ අනුව දකුණු | අමාත්‍යාංශය මගින් ව්‍යාපෘති කිරීමේ ප්‍රගතිය වර්ෂය පුරා අධීක්ෂණය කරනු ලබයි. ත්‍රෛමාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී පසුබෑමට ලක්ව ඇති ව්‍යාපෘති පිළිබඳව ආයතන | පසු විපරම් කටයුතු විධිමත් පරිදි සිදු කර සංවර්ධන ව්‍යාපෘති පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. සංවර්ධන ව්‍යාපෘති තුළින් වූ ප්‍රවණතාවය අධ්‍යනය කිරීමට වැඩපිළිවෙලක් හා |

| | | | |
|---|---|---|---|
| | පළාතේ ජන ජීවිතයට, දකුණු පළාත් සභාවේ ආදායමට, සේවා වියුක්තියට, කෘෂි ආර්ථිකයට, ධීවර ක්ෂේත්‍රයට හා ඉදිකිරීම් ක්ෂේත්‍රයට වූ බලපෑම යනාදී වශයෙන් මේ දක්වා සංවර්ධන ව්‍යාපෘති තුළින් වූ ප්‍රවණතාවය අධ්‍යනය කිරීමට වැඩ පිළිවෙලක් හා අවශ්‍ය දත්ත සහ තොරතුරු දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලය සතුව නොතිබුණි. | ප්‍රධානීන් දැනුවත් කරනු ලබයි. ඉදිරියේදී මේ පිළිබඳව අවධානය යොමු කරන බව සහ ඉදිරියේදී මෙම කටයුතු වැඩිදියුණු කිරීමට අදහස් කරන බව. | ඒ සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් කොමිෂන් සභාව විසින් එකඟතාවය ලබාදෙනු ලබන වාර්ෂික සංවර්ධන සැලැස්මේ සංවර්ධන ව්‍යාපෘති වර්ෂය තුළ සංශෝධනයට ලක්වීම නිසා වාර්ෂික සංවර්ධන සැලැස්මේ යෝජනා බොහොමයක් සංශෝධනය කිරීමට සහ ඒ සඳහා අනුමැතිය ලබාදීමට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලයට සිදුවී තිබුණි. | විගණන නිරීක්ෂණ පිළිගනිමි. ඉදිරියේදී සුදුසු පරිදි ක්‍රියාත්මක කිරීමට නිලධාරීන් දැනුවත් කරන ලද බව. | නිශ්චිතව හඳුනාගත් සංවර්ධන ව්‍යාපෘති සැලැස්මට ඇතුළත් කළ යුතුය. |

**4. කාර්ය මණ්ඩල පරිපාලනය**

**4.1 පළාත් සභා ආයතනවල කාර්යමණ්ඩල පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභා නිලධාරීන් 5,427 ක පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර දකුණු පළාත් සභාව තුළ අනුමත සේවක සංඛ්‍යාවට පරිබාහිරව අනියම්/ ආදේශක/ කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු නිලධාරීන් සංඛ්‍යාව 1,016 ක් විය. | දීප ව්‍යාප්ත සේවාවන්හි තනතුරු සඳහා නිලධාරීන් අනුයුක්ත කරන මෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. දීප ව්‍යාප්ත මට්ටමේ තනතුරු හා කළමනාකරණ සේවා චක්‍රලේඛයටතේ බඳවා ගැනීම් තාවකාලිකව නතර කර ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු අතර, අනුමත සේවක සංඛ්‍යාවට පරිබාහිරව සේවකයින් බඳවා ගැනීම සීමා කළ යුතුය. |

4.2 අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගාල්ල අධ්‍යාපන කලාපයේ සිංහල මාධ්‍ය පාසල්වල විෂයයන් 26 කට අදාළව ගුරුවරුන් 363 ක අතිරික්තයක් පැවතියදී කලාපයේ එම විෂයයන්ට අදාළව තවත් පාසල් 162 ක ගුරු ඌනතාවයක් පැවතුණි. ඉංග්‍රීසි විෂය සඳහා එක් ගුරුවරයෙකුවත් නොමැති පාසල් 07 ක් පැවතියදී කලාපයේ වෙනත් පාසල්වල ඉංග්‍රීසි විෂය සඳහා ගුරුවරුන් 12 ක අතිරික්තයක් විය. | නවක ගුරු පත්වීම් වලින් හැර එම පුරප්පාඩු පිරවීම අසීරු කාර්යයක් බවත් අන්තර් කලාප හෝ අධ්‍යාපන පළාත් ස්ථාන මාරුවීම් වලින් පැමිණෙන ගුරුභවතුන් ගෙන්ද පිරවීමට අපහසු බව. | විධිමත් ලෙස ගුරු තුලනයක් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

**5.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**--------------------------------------------**

**5.1** **අයවැය ලේඛනමය පාලනය**

**-----------------------------------**

| විගණන නිරීක්ෂණය<br>----------------------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------------- | නිර්දේශය<br>---------- |
| --- | --- | --- |
| වියදම් ශීර්ෂ 26 හි ශුද්ධ ප්‍රතිපාදනවල එකතුව රු.48,434,575,361 ක් වූ අතර වියදම රු.44,294,274,623 ක් විය. ඒ අනුව රු.4,140,300,738 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර, එම අගයයන් රු.633,537 සිට රු.698,682,489 අතර පරාසයක පැවතුණි. | ඒ ඒ ආයතන වෙත නිකුත් කර ඇති විගණකාධිපති වාර්තා තුළින් නිරීක්ෂණ ඉදිරිපත් කර ඒ සඳහා පිළිතුරු ඉදිරිපත් කර ඇත. ඉදිරියේදී මේ සම්බන්ධව කටයුතු කරන බව. | අනුමත ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ යුතුය. |